**වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගමේ (“සමාගම”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් **වර්ෂය** සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 හි 09 වැනි ඡේදය අනුව හානිකරන ඇඟවුම් ලැබී තිබුණද ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවෙහි කිසිදු වත්කමක් සඳහා සමාගම විසින් හානිකරන සමාලෝචනයක් සිදු කර නොතිබුණි. විගණන දිනය වන විට වත්කම් බොහොමයක් නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. එබැවින්, වත්කම්වල අයකරගත හැකි වටිනාකම පොත් වටිනාකමට වඩා අඩු විය හැකි බැවින් ශුද්ධ වත්කම් තත්ත්වය අධිගණනය වී ඇත. | නාගරික සංවර්ධන අධිකාරියවිසින් මෙම පරිශ්‍රය සහ ව්‍යාපාරික මෙහෙයුම් ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයකට අභිලාෂයන් කැඳවීම (RFP) හරහා පැවරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. එබැවින් තවදුරටත් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආයෝජනය කිරීමට අදහසක් නැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අදාළ වන ඡේදයන්ට අනුකූල වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවට ලැබිය යුතු SLFRS 15 හි 09 වන ඡේදයට පටහැනිව ආදායමක් ලෙස හඳුනාගෙන තිබූ රුපියල් 25,000 ක පරිත්‍යාගයක් මුදලක සහ ප්‍රතිසංස්කරණ සඳහා අනුග්‍රාහක මුදලක් වන රුපියල් 352,922 මුදලක් අයකරගත නොහැකි වුවද ඒ සඳහා SLFRS 09 හි 5.5 ඡේදයට අනුව හානිකරණ ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | සටහන සටහන් කර ගන්නා ලදි. එකඟ වූ අනුග්‍රාහකත්ව ගෙවීම සඳහා වූ අපේක්ෂිත කාලසීමාව සලකා බලා, 2022 මූල්‍ය වර්ෂය සඳහා හානිකරණ ප්‍රතිපාදන සිදු කර නොමැත. කෙසේ වෙතත්, සැපයුම්කරුගේ තහවුරුවෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අනුග්‍රාහකත්වය ගෙවීම 2023 මූල්‍ය වර්ෂයේ කපා හරින බව. | - එම - |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා විලම්භිත බදු ගණනයේදී වැරදීමකින් වර්ෂ අවසාන පහළට ගෙන ආ බදු අලාභය ගැනීමකින් තොරව 2021/2022 බදු වාර්තා අනුව ඉදිරියට ගෙන ශේෂය ගෙන ඇති බැවින් විලම්බිත බදු වත්කම රු. 785,363 කින් අධි ගණනය වී ඇත. | නිරීක්ෂණයේ සඳහන් පරිදි අදහස සටහන් කර ගන්නා ලද අතර 2023 වර්ෂයේදී එය නිවැරදි කරන බව. | 2023 මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු. 100,458,055 ක මුදල ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවෙහි ගෙවිය යුතු වැට් බදු රු. 99,124,620 ක් ඇතුළුව වගකීම් පියවීම සඳහා | නිරීක්ෂණයේ සඳහන් පරිදි අදහස සටහන් කර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2020 ඔක්තෝම්බර් මාසයේ සිට ලැබිය යුතුය. කෙසේ වෙතත්, ගෙවිය යුතු වැට් බදු මුදල නොවිසඳී ඇති කරුණක් නිසා එය විසදා අවසන් වන තෙක්, රු. 100,458,055 ක මුදල පියවීමට නාගරික සංවර්ධන අධිකාරිය බලා සිටී. සමාගම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | 2022 ඔක්තොම්බර් 06 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PE/ COP/POLI/ අනුව රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයින්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 55 සහ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වාද සංශෝධනය කර තිබුණද, සමාගම එහි විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සාධාරණ හේතුවක් නොමැතිව විශ්‍රාම වයස අවුරුදු 69 ලෙස උපකල්පනය කර ගණනය කර තිබුණි. එබැවින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු. 240,929 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් පරිදි අදහස සටහන් කර ගන්නා බව හා ඉහත කොන්දේසිය 2023 සිට සමාගම විසින් අනුගමනය කරන බව. කෙසේ වෙතත්, 80 ක්ලබ් කාර්ය මණ්ඩලයෙන් සේවය දිගටම කරගෙන ගිය එක් සේවකයෙක් සිටියේය. එබැවින්, එම සේවකයා සඳහා ද පාරිතෝෂිත වෙන් කිරීම ගණනය කරන ලද බව. කෙසේ වෙතත්, එම සේවකයා 2023 අගෝස්තු 16 වන දින 80 ක්ලබ්හි තම තනතුරෙන් ඉල්ලා අස්වී ඇත. | ගණනය කිරීම් සඳහා නිවැරදි උපකල්පන භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් සඳහා භාවිතා කරන ලද වත්කම්වල සෘජු ක්ෂයවීම් පිරිවැය රුපියල් 249,052 ක් විකුණුම් පිරිවැය යටතේ වාර්තා නොකර පරිපාලන වියදම් යටතේ සටහන් කර ඇත. එම නිසා දළ ලාභය එම මුදලින් වැඩිපුර දක්වා තිබුණි. | ක්ෂයවීම් සාමාන්‍ය ගිණුම්කරණ භාවිතයක් ලෙස පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කර ඇත. ගොඩනැගිලි හා අනෙකුත් ස්ථාවර වත්කම් සමාගමේ ආදායම් උත්පාදනයට සෘජුවම දායක වුවත් පරිපාලන වියදම් යටතේ ක්ෂය කිරීම් සහ ගිණුම්ගත කිරීම් සිදු කර ඇත. එබැවින්, ඉහත ගණනය කිරීම් සඳහා එම පදනමම යොදා ගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලදීද එය සලකා ඇත. | වඩාත්ම සුදුසු ගිණුම්කරණ පිළිවෙත් අනුගමනය කළ යුතුය. |
| (ඉ) | ස්ථාවර වත්කම් යටතේ සමාගමට අයත් නොවන සහ සමාගමට කිසිදු ආර්ථික ප්‍රවාහයක් නොමැති රුපියල් 2,000,000 ක් වටිනා මෝටර් වාහන (Jet Key) ඇතුළත් වේ වේ. තවද, 2022 දෙසැම්බර් 31 දිනට ඒහි ක්ෂයවීම් ලෙස රුපියල් 1,125,000 ක් වෙන් කර තිබුණි. | ඔක්තෝබර් 01 වැනි දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් වත්කම් හා බැරකම් පැවරීමේදී ඉහත කී මෝටර් රථය (Jets Key) වෝටර්ස් එජ් රික්‍රියේෂන් ලිමිටඩ් වෙත පවරා දෙන ලදී. ඒ අනුව, වත්කමේ වටිනාකම රුපියල් 2,000,000 කට අගය කර ඇත. කෙසේ වෙතත්, එම වත්කම් භාවිතය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ආයතන පරිශ්‍රය තුළ නොමැති වීම හේතුවෙන්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2023 වර්ෂයේදී එම වත්කම් බැහැර කිරීමට සමාගම අවශ්‍ය පියවර ගනු ඇත. | සමාගමට ආර්ථික ප්‍රවාහයක් ගෙන ඒමට හැකි වන අයුරින් වත්කම් භාවිතා කිරීමට සහ වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සම්පූර්ණ වගකීම් එහි මුළු වත්කම් රුපියල් 8,092,801 කින් ඉක්මවා ඇති අතර 2021 සහ 2022 වසර සඳහා මෙහෙයුම් වලින් අඛණ්ඩ අලාභයන් පිළිවෙලින් රුපියල් 14,205,722 සහ රුපියල් 1,971,616 වාර්තා කර ඇත. තවද සමාලෝචිත වර්ෂය අවසානයේදී ජංගම වගකීම්, රුපියල් 27,531,234 කින් ජංගම වත්කම් ඉක්මවා ඇත. මෙම සිදුවීම් මගින් පෙන්නුම් කරනු ලබන්නේ සමාගමට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව වන අතර එම නිසා සමාගමට සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළින් එහි වත්කම් උපයෝජනය කර ගැනීමට සහ වගකීම් පියවීමට නොහැකි විය හැකිය. සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල (සහ එහි සටහන්) මෙම කරුණ සමඟ පවතින සැලසුම්, කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කර ඇති හෝ පවතින වෙනත් අවම කිරීමේ සාධක සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් පිළිබඳව අනාවරණය නොකරයි. | විගණන නිරීක්ෂණ සමඟ අදහස සටහන් කර ගන්නා බව. අනාගතයේදී මෙහෙයුම් කටයුතු සුමටව ක්‍රියාත්මක වීම සඳහා සමහර මෙහෙයුම් ගැටළු අවම කර විසඳීමට වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අවස්ථා කිහිපයකදී සාකච්ඡා කර ඇත. ඉහත සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක ආයෝජනට ඇල්මැති පාර්ශවයන්ගෙන් විධිමත් ප්‍රාග්ධන ආයෝජනයක් සඳහා අභිලාෂයන් කැඳවීමේ (RFP) තත්වයට පත් වුණි. මෙය 2023/2024 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය. | අඛණ්ඩ පැවැත්ම පිළිබද ගැටලු මගහරවා ගැනීමට සැලසුම් සකස් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 80 ක්ලබ් හි ණය ගැතියන්ගේ කාල විශ්ලේෂණයට අනුව, 2022 දෙසැම්බර් 31 වන දිනට ණය ගැතියන් විසින් ගෙවිය යුතු මුදල රුපියල් 1,396,126 ක් වන අතර එයින් රුපියල් 793,069 ක් හෙවත් සියයට 57 ක මුදලක් දින 120 කට වැඩි කාලයක සිට නොපියවා ඇත. | රුපියල් 793,069 අතරින් රුපියල් 769,575 ක මුදල 80 ක්ලබ් කමිටුව විසින් දේපල කළමනාකරණය කරන විට නිෂ්කාශනය නොකළ හිඟ විදුලි බිල වේ. මෙහෙයුම් කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිය විසන්ධි වීම් වැලැක්වීම සඳහා, සමාගම 80 ක්ලබ් කමිටුව වෙනුවෙන් ගෙවීම් පියවා ඇත. කෙසේ වෙතත්, 80 ක්ලබ් ආයතනයේ ආරම්භයේ සිටම අයිතිය පවතින, දැනට 80 ක්ලබ්හි සාමාජිකයින් විසින් භාවිතා කරනු ලබන වත්කම් කිහිපයක් මෙම වසරේදී මෙම ශේෂයෙන්න් හිලව් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ සාකච්ඡාවන් සිදුවෙමින් පවතී. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රථිඵලය රු. 867,940 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.11,000,061 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපලයෙහි රු.11,868,001 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම ඉහලයාම හා අනෙකුත් ආදායම් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාගමේ වැදගත් අනුපාතයන් පහත පරිදි වේ.

| අනුපාතය | 2022 | 2021 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 0.88 (වාර) | 0.88 (වාර) |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.78 (වාර) | 0.84 (වාර) |
| දළ ලාභ අනුපාතය | 40% | 48% |
| ශුද්ධ ලාභ අනුපාතය | (0.9) % | (16) % |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ අවසාන මව් ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය 80 ක්ලබ් ආයතනයේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 411.42 ක් වැය කර ඇතත්, 80 ක්ලබ් ආයතනයේ ප්‍රධාන ආදායම වන සමාජයේ සාමාජික ගාස්තු ආදායම සමාගමට හෝ නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සමාජයේ සාමාජික ගාස්තු ආදායම රුපියල් 19,484,722 කි. ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව 80 ක්ලබ් කමිටුව විසින් සාමාජික ගාස්තුව එකතු කරන ලද අතර කමිටුව නාගරික සංවර්ධන අධිකාරියට මාසික ගාස්තුව රුපියල් මිලියන 1.2 ක් සහ සමාගමට රුපියල් 505,000 ක් පමණක් ගෙවා ඇත. මෙවැනි විශාල ආයෝජනයක් සඳහා එවැනි අඩු ප්‍රතිලාභයක් ලබා ගැනීම නාගරික සංවර්ධන අධිකාරියේ හෝ සමාගම යන දෙපාර්ශවයටම මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවේ. | නාගරික සංවර්ධන අධිකාරිය, වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම සහ 80 ක්ලබ් අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව ව්‍යාපාරික කටයුතු කළමනාකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම එකඟ වී ඇත. මෙම ගිවිසුමට අනුව වෝටර්ස් එජ් රික්‍රියේෂන් ලිමිටඩ් 80 ක්ලබ් සාමාජිකයින්ගෙන් ආහාර සහ පාන ආදායම පමණක් ලබා ගන්නා අතර නාගරික සංවර්ධන අධිකාරිය මාසික කුලිය 80 ක්ලබ් කමිටුවෙන් ලබා ගනී. කෙසේ වෙතත්, 80 ක්ලබ් හිමිකරු ලෙස, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් අයකර ගැනීම සඳහා මෙම පරිශ්‍ර සහ ව්‍යාපාර මෙහෙයුම උනන්දුවක් දක්වන පාර්ශ්වයකට අභිලාෂයන් කැඳවීම (RFP) හරහා භාර දීමට කටයුතු කරමින් සිටී. | මෙම ආයෝජනය මූල්‍යමය වශයෙන් ශක්‍ය එකක් බවට පත් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| බදු අය කළ හැකි ව්‍යාපාර ආදායම තහවුරු කිරීමේදී සමාගම විසින් රුපියල් 892,056 ක පාරිතෝෂිත ගෙවීමක් වසර සඳහා අඩු කර නොතිබූ බැවින් ඉදිරියට ගෙන ගිය බදු අලාභය අඩුවෙන් දක්වා ඇත. | නිරීක්ෂණයේ සඳහන් පරිදි සටහන් කර ඇති අතර මෙය 2022/2023 අවසාන ආදායම් බදු ගණනය කිරීමේ වර්ෂයේදී නිවැරදි කරන ලදී. | 2022/2023 තක්සේරු වර්ෂයේ අවසාන බදු ගණනය කිරීමේදී නිවැරදි කිරීමට අවශ්‍ය වේ. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ආරක්ෂක ආයතන සමඟ විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවෙහි සහ 80 ක්ලබ් සඳහා රු 5,221,135 ක මුදලක් ආරක්ෂක ගාස්තු ලෙස වියදම් කර තිබුණි. තවද, ඉදිරිපත් කළ පැමිණීමේ පත්‍රිකාවලට අනුව ඔටර්ස් ක්‍රීඩා සමාජයේ ආරක්ෂක නිලධාරීන් පැය 24 ක සේවා වැඩ මුර කර තිබූ අතර ඇතැම් ආරක්ෂක නිලධාරීන් පැය 156ක් අඛණ්ඩව සේවය කර තිබූ බව නිරීක්ෂණය විය. මෙය සමාජ ශාලාවල ආරක්ෂාවට අයහපත් ලෙස බලපානු ඇත. | ආරම්භයේ සිටම සිටින ලද ආරක්ෂක ආයතන සමාජ ශාලා දෙකෙහිම ආරක්ෂාව සඳහා කටයුතු කර තිබූ බැවින්, ගිවිසුම් විධිමත් කිරීම සඳහා, වෝටර්ස් එජ් ලිමිටඩ් හි ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව හරහා වෝටර්ස් එජ් ලිමිටඩ් සමඟ එක්ව 2024 වසරේ සිට ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. | ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුයි. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවේ ටෙනිස් පිටියේ තාප්පයෙන් වෙන්කර තිබූ පර්චස් 2ක පමණ ඉඩම ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම පරිශ්‍ර සහ ව්‍යාපාරික මෙහෙයුම උනන්දුවක් දක්වන පාර්ශ්වයකට අභිලාෂයන් කැඳවීම (RFP) හරහා පැවරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. එබැවින් තවදුරටත් ප්‍රතිසංස්කරණය සඳහා ආයෝජනය කිරීමට අදහසක් නැත. | පවතින සම්පත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවෙහි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට පෙර ඉදිකරන ලද තාර ඇතිරූ පැසිපන්දු පිටිය සහ විවෘත වේදිකාව අතර ගොඩනැගිල්ල කිසිදු කාර්යයක් සඳහා භාවිතා කර නොතිබූ අතර ආයතනයේ භාවිතයට ගත නොහැකි අබලි භාණ්ඩ ගබඩා කර පැවතුනි. | - එම - | - එම - |

| | | |
|---|---|---|
| (ඇ) ආයතනයේ පවතින වර්ග අඩි 1680 ක වායුසමීකරණය කරන ලද හා වර්ග අඩි 1692 ක වායුසමීකරණය නොකරන ලද උත්සව ශාලා දෙක වැඩිදියුණු කර උත්සවයන් සඳහා කුලී පදනම සඳහා ලබාදී ඉහල ආදායමක් ඉපයිය හැකි වුවද මෙම පරිශ්‍රය රු. 241,350 ක ආදායමක් පමණක් උපයා තිබුණි. කෙසේ වෙතත් මෙම පරිශ්‍රය කුලීපදනම මත ලබාදීමට උත්සව ශාලාව සඳහා අවශ්‍ය පහසුකම් (සනීපාරක්ෂක පහසුකම්, සැරසිලි, ගෘහභාණ්ඩ) නොමැති බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඈ) ආයතනයේ ගොඩනැගිලි භාවිතයට සුදුසු තත්ත්වයේ සහ ආරක්ෂිතව නොතිබූ අතර ප්‍රධාන පුවරුව සහ බල සැපයුම් පරිපථ ද අනතුරුදායක තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (ඉ) කොළඹ 07, සරණ මාවතේ හෙක්ටයාර් 1.163 ක පමණ වපසරියකින් යුත් ඔටර්ස් ඇක්වටික් සමාජශාලාව පවත්වාගෙන යන ඉඩම සහ පරිශ්‍රය ක්‍රීඩාවට මුල්තැන දෙමින් ඉතා ඵලදායිව හා අලංකාර ලෙස පවත්වාගෙන යා හැකි ස්ථානයක් වුවද ඌන උපයෝජිතව පැවතීම හේතුවෙන් රජයේ දේපල නිසි නඩත්තුවකින් තොරව අකාරයක්ෂමව පවතින බව නිරික්ෂණය විය. | - එම - | - එම - |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| බොහෝ භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.4.3 වගන්තියට පටහැනිව, සමාගමේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් තොරව විවෘත වෙළඳපොලෙනි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. සමාගම 2023 මාර්තු 01 දින සිට සමාගමට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී මධ්‍යගත ප්‍රසම්පාදන පද්ධතියක් හරහා ක්‍රියාවට නංවනු ඇත. එබැවින් සීමාසහිත වෝටර්ස් එජ් හි ලියාපදිංචි සැපයුම්කරුවන් වෝටර්ස් එජ් රික්‍රියේෂන් ලිමිටඩ් සඳහාද භාණ්ඩ හා සේවා සපයනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල වගන්ති වලට අනුකූල වීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ ක්‍රමවේදයක් (SOR) නොතිබුණි. | සමාජ ශාලා දෙකටම මව් සමාගම වශයෙන් වෝටර්ස් එජ් ලිමිටඩ් ආයතනය, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ අවශ්‍යතා තක්සේරු කරමින් පවතින පුරප්පාඩු ප්‍රසිද්ධ කර සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීමෙනි. | සමාගම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සකස් කර අනුමත කර ගැනීමට අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විධිමත් ගිවිසුමක් අත්සන් නොකර සමාලෝචිත වර්ෂය සඳහා නඩත්තු කාර්ය මණ්ඩලය සැපයීම සඳහා සමාගම රුපියල් 1,761,535 ක් ගෙවා ඇත. | ගිවිසුම් විධිමත් කිරීම සඳහා 2023 වසරේ සිට සීමාසහිත වෝටර්ස් එජ් හි ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව හරහා ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය සිදු කෙරේ. | ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ආයතනික සැලැස්ම සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම කෙටුම්පත් කර ඇති අතර මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම සඳහා අභිලාෂයන් කැඳවීම (RFP) හේතුවෙන් එය තාවකාලිකව අත්හිටුවා ඇත. | උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන ගැටළුව | කළමනාකරණ අදහස | නිර්දේශය |
|---|---|---|
| වාණිජ ඉලක්ක සහිත ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව වර්ෂය තුළ සිදු කිරීමට බලාපොරොත්තු වූ ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැස්ම සමාගම විසින් සකස් කර නොතිබුණි. | පවතින මූල්‍ය සඳහා ක්ෂණික ක්‍රියාකාරී සැලැස්ම ලෙස ආයතනික අයවැය සැලකේ. එබැවින් වර්ෂය සඳහා මණ්ඩලය අනුමත කරන ලද අයවැය ආසන්නතම ක්‍රියාකාරී සැලැස්ම ලෙස සැලකේ. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |